# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2297/27 – 2022 සැප්තැම්බර් 12 වැනි සඳුදා – 2022.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟල පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, රදවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/NUL/2020/166 හා 2020.09.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – රජාවෙල ගම්මැද්ද – ප්‍රමාණය: හෙක්. 0.1071**

උතුරට: ඩී. එම්. තිලකරත්න හිමිකම් කියන රජාවෙල ගම්මැද්ද; නැගෙනහිරට: ඒ. ජී. උක්කුබන්ඩා හිමිකම් කියන රජාවෙල ගම්මැද්ද; දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: ආර්. එම්. ශාන්ත දිසානායක හිමිකම් කියන රජාවෙල ගම්මැද්ද.

02. **කැබලි අක්ෂර 'බී' – රජාවෙල ගම්මැද්ද – ප්‍රමාණය: හෙක්. 0.1014**

උතුරට: ආර්. එම්. ශාන්ත දිසානායක හිමිකම් කියන රජාවෙල ගම්මැද්ද සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට: ඒ. ජී. උක්කුබන්ඩා හිමිකම් කියන රජාවෙල ගම්මැද්ද; දකුණට: මාර්ගය සහ එම්. ජී. බාලමැණිකේ හිමිකම් කියන රජාවෙල ගම්මැද්ද; බටහිරට: එම්. ජී. බාලමැණිකේ, ඒ. ජී. උක්කුබන්ඩා සහ ආර්. එම්. ශාන්ත දිසානායක හිමිකම් කියන රජාවෙල ගම්මැද්ද.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2019/MV/183.
2022 ජුනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
1200/6
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 09 – 0112


1A – G37460 – 14 (2022/09)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*